# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය: 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல்: 011-2868426
*web : www.elections.gov.lk*
*e-mail : info@elections.gov.lk*

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம
சரண மாவத்தை, இராஜகிரிய(10107)


මගේ අංකය: **TR/PE/01/2020** ඔබේ අංකය : දිනය : 2020.07.06
எனது இல. உமது இல. திகதி

**චක්‍රලේඛ අංක - PE/2020/TR-09**

**සියළුම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් සහ**
**නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**පාර්ලිමේන්තු මැතිවරණය-2020.08.05**
**ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන්/ සහකාර තේරීම්භාර නිලධාරීන් සතු පෞද්ගලික වාහන භාවිත කිරීම.**

තම සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයක ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී වශයෙන් හෝ ගණන් කිරීමේ සහකාර තේරීම් භාර නිලධාරී වශයෙන් හෝ ඡන්ද විමසීම් රාජකාරි සඳහා සහකාර තේරීම්භාර නිලධාරී වශයෙන් හෝ කටයුතු කිරීම සඳහා තෝරා ගන්නා ලද නිලධාරීන්ට පෞද්ගලික වාහනයක් ඇත්තේ නම් එය ඡන්ද විමසීමේ රාජකාරී සඳහා වාර්තා කිරීමට දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත යාමට හා ඡන්ද විමසීමේ කටයුතු නිමවීමෙන් පසු ආපසු තම නිවස බලා ඒම සඳහා යොදා ගැනීම අනුමත කරමි. සේවයේ නිරත දිස්ත්‍රික්කයෙන් බැහැර දිස්ත්‍රික්කයක එබඳු රාජකාරී සඳහා තෝරා ගෙන ඇති නිලධාරියෙකු එම දිස්ත්‍රික්කයට යාමට තම පෞද්ගලික වාහනය යොදා ගන්නේ නම් ඒ සඳහා අදාළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරීගේ නැතහොත් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. නිලධාරියා සේවයේ නියුතු දිස්ත්‍රික්කයෙන් බැහැර ඉතා දුරබැහැර දිස්ත්‍රික්කයක රාජකාරී පැවරී ඇති නිලධාරීන්ගේ ඉල්ලීම් අනුමත කළ යුත්තේ රජයට අධික වැය බරක් දැරීමට සිදු නොවන්නේ නම් පමණි.

02. රාජකාරී සඳහා යාමට තම පෞද්ගලික වාහනය යොදා ගැනීමට අනුමැතිය ඉල්ලුම් කරන නිලධාරීන්ට පහත සඳහන් කොන්දේසි යටතේ අනුමැතිය දීම හා ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 8:2 වගන්තියට අනුව පෙට්‍රල් වාහනයක් සඳහා කිලෝ මීටරයකට රු.12.00 ක් ද, ඩීසල් වාහනයක් සඳහා රු.8.00 ක් ද යටතේ එම රාජකාරී ගමන් සඳහා කිලෝමීටර් ගාස්තු ගෙවීම අනුමත කරමි. පෞද්ගලික වාහනය රැගෙන එනු ලබන මෙම නිලධාරීන්ට වාහනය ධාවනය කළ දුර අනුව (යාමට හා ඊමට) පහත සඳහන් පරිදි විශේෂ දීමනාවක් ගෙවිය හැකිය. මෙම දීමනාව ලබා ගැනීම සඳහා වාහනය භාවිත කළ නිලධරයා විසින් පොදු 35 වචුවරයක තම අත්සන යොදා ගමන් වියදම් වවුචරය සමග ඉදිරිපත් කළ යුතුය.

| අංකය | විස්තරය | මුදල (රුපියල්) |
|---|---|---|
| 1. | සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කය තුළ | 900.00 |
| 2. | ස්වකීය නිත්‍ය සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරීවල නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට දුර කි.මී.50 දක්වා | 1300.00 |
| 3. | ස්වකීය නිත්‍ය සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරීවල නිතරවූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට දුර කි.මී. 100 දක්වා | 1700.00 |
| 4. | ස්වකීය නිත්‍ය සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරීවල නිරතවූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට දුර කි.මී.150 දක්වා | 2100.00 |
| 5. | ස්වකීය නිත්‍ය සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරීවල නිරතවූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට දුර කි.මී.150 ට වැඩි | 2500.00 |

2 වන පිටුවට

03. කොන්දේසි

I. වාහනය මනා ධාවන තත්වයකින් යුත් එකක් විය යුතුය.

II. වාහනය මහජන කැළඹිලි, කැරලි කෝලහාල ඇතුළු පූර්ණ රක්ෂණ ආවරණය සහිත එකක් විය යුතු අතර කිසියම් හදිසි අනතුරකින් හෝ වෙනයම් ආකාරයකින් වාහනයකට හානියක් සිදුවුවහොත් එහි සියළු වගකීම රක්ෂණ ආයතනය හෝ තමන් විසින් විඳ දරාගත යුතුය. ඒ සඳහා කිසිදු ආකාරයකින් මැතිවරණ කොමිෂන් සභාව මැදිහත් වීමක් සිදු නොවනු ඇත.

III. අදාළ වාහනයේ හිමිකාරීත්වය නිලධාරියාගේ හෝ කලත්‍රයාගේ විය යුතුය. විශේෂ හේතූන් යටතේ අවිවාහක නිලධාරීන් සඳහා පියා / මව, සොහොයුරු සොහොයුරියන්ගේ හෝ විවාහක නිලධාරීන් සඳහා පියා / මව, දූදරුවන් සතු වාහන හෝ භාවිතා කිරීම සඳහා ද අවසර දීම සළකා බැලිය හැකිය. (එය තහවුරු කිරීම සඳහා V-4 ආකෘතිය පූරවා භාරදෙනු ලබන අවස්ථාවේදී රථයේ ආදායම් බලපත්‍රයේ ඡායා පිටපතක් අමුණා තිබිය යුතුය.)

IV. ඉල්ලා ගත් වාහනයක් පාවිච්චි කිරීම අනුමත කළ හැක්කේ අදාළ වර්ෂය මුල තම දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් රාජකාරි කටයුතු සඳහා ඉල්ලා ගත් පෞද්ගලික වාහනයක් භාවිතා කිරීමට ලබා දී ඇති අනුමත ලිපියේ පිටපතක් ද සමග ඉල්ලුම් කරන්නේ නම් පමණි.

V. **මෙම වාහනය සඳහා නිලධාරියා සේවය කරන කාර්යාලයෙන් හෝ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් හෝ කිසිදු අයුරකින් ඉන්ධන ලබාදීමක් සිදු නොකළ යුතුය. එබැවින් එවැනි ඉල්ලීම් කුමන අවස්ථාවකදී හෝ භාර නොගත යුතුය.**

04. තම පෞද්ගලික වාහනයෙන් පැමිණෙන ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන්/ සහකාර තේරීම් භාර නිලධාරීන් තේරීම් භාර නිලධාරී වෙත වාර්තා කළ වහාම, V-4 ආකෘති පත්‍රය පිටපත් දෙකකින් සම්පූර්ණ කර වාහනයේ ආදායම් බලපත්‍රයේ ඡායා පිටපතක්ද සමඟ සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) වෙත ලබාදිය යුතුය. V-4 ආකෘති පත්‍රයේ ආදර්ශයක් මේ සමග අමුණා ඇත. ඡන්ද විමසීම් කටයුතු අවසන් වී නිලධාරියා ආපසු පිටත්වීමට ප්‍රථම සහකාර තේරීම්භාර නිලධාරී (ප්‍රවාහන) එම පත්‍රිකාවෙහි "ආ" කොටස සම්පූර්ණ කර එක් පිටපතක් අදාළ නිලධාරියාට භාර දිය යුතුය. නිලධාරියා **<u>ගමන් වියදම් ඉල්ලුම් කිරීමේදී එම V-4 පත්‍රිකාව වවුචරයට අමුණා ඉදිරිපත් කළ යුතුවේ. මෙම සහතිකය නොමැති කිසිදු ගමන් වියදම් වවුචරයකට ගෙවීම් නොකිරීමට ගෙවීම් නිලධාරීන් වග බලාගත යුතුවේ.</u>**

05. තමන් වාහනය රැගෙන එන බවට තේරීම් භාර නිලධාරී / නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්ගෙන් අනුමැතිය ලබා ගන්නා අවස්ථාවේදීම පෞද්ගලික රියදුරු මහතෙකු රැගෙන එන්නේ නම් ඒ සඳහා ද අනුමැතිය ලබා ගත යුතුය. ඔහුට ගෙවනු ලබන දීමනාව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් තම පෞද්ගලික වාහනය සමග රියදුරෙකු රැගෙන ආ විට ගෙවනු ලබන ආකාරයටම වේ. **<u>මෙම ගෙවීම් කරනු ලබන්නේ අදාළ රියදුරාගේ නමට පමණි.</u>** නිලධාරියා විසින් භාරදිය යුතු V-4 ආකෘතියට අමතරව, රියදුරු විසින් <u>V-5 ආකෘතිය පිටපත් දෙකකින් සම්පූර්ණ කර සහකාර තේරීම්භාර නිලධාරී (ප්‍රවාහන) වෙත ලබාදිය යුතුය</u>. ඔහු විසින් එහි"ආ" කොටස සම්පූර්ණ කිරීමෙන් පසු එක් පිටපතක් රියදුරුගේ පැමිණීමේ සහතිකය ලෙස ගමන් වියදම් වවුචරයට අමුණා ඉදිරිපත් කිරීම සඳහා රියදුරුට භාරදිය යුතුය. වවුචරය සමග රියදුරු බලපත්‍රයේ ඡායා පිටපතක් ද අමුණා ඉදිරිපත් කරන ලෙසට රියදුරු දැනුවත් කළ යුතුය. V-5 ආකෘතියක් ද මේ සමග අමුණා ඇත. පෞද්ගලික **<u>වාහනය රැගෙන නොපැමිණෙන කිසිම නිලධාරියෙකුට වාහනය රැගෙන පැමිණි බවට සහතිකයක් නිකුත් කිරීමෙන් වැළකී සිටිය යුතු</u>** අතර එසේ වාහන නොගෙනැවිත් සහතික ඉල්ලා සිටින නිලධාරීන් පිළිබඳව වාර්තා තබාගෙන මා වෙත එවීමට කරුණාකර කටයුතු කරන්න.

3 වන පිටුවට

06. දිස්ත්‍රික්කයන්හි ප්‍රමාණවත් තරම් මාණ්ඩලික නිලධාරීන් නොමැති වීම නිසා පිටතින් සහකාර තේරීම්භාර නිලධාරීන් විශාල ප්‍රමාණයක් ලබා ගන්නා **ගම්පහ, කළුතර , කෑගල්ල හා පුත්තලම** යන දිස්ත්‍රික්ක තුල **කලාප රාජකාරි සඳහා යෙදවීමට ප්‍රමාණවත් වාහන සංඛ්‍යාවක් නොමැතිවිටදී** කලාප රාජකාරි සඳහා යොදවනු ලබන පිටතින් පැමිණෙන සහකාර තේරීම්භාර නිලධාරීන්ගේ වාහන ඒ සඳහා යෙදවිය හැකිය. මේ සඳහා මරුටි, ස්ටාලට් වැනි කුඩා වාහන යොදවා නොගත යුතුය. සෙසු දිස්ත්‍රික්ක වල කලාප සහකාර තේරීම්භාර නිලධාරීන්ට රජයේ වාහන ලබා දීමට ක්‍රියාකල යුතු අතර දිස්ත්‍රික්කයේ සේවයේ නියුතු නිලධාරීන්ට කලාප රාජකාරි සඳහා ඔවුන්ගේ පෞද්ගලික හෝ වෙන්කල වාහන යොදවා ගැනීමට අනුමැතිය දීම යෙහෙකි.

07. කලාප සහකාර තේරීම්භාර නිලධාරීන් ලෙස පත්වීම් ලබා ඇති මෙම නිලධාරීන් රැගෙන එන වාහන සඳහා පෞද්ගලික රියදුරෙකු යොදවා ගත යුතුය. මේ සමඟ අමුණා ඇති ආකෘතියට අනුව සහකාර තේරීම්භාර නිලධාරී (ප්‍රවාහන) විසින් CR පොතක් සකස් කර අදාල විස්තර සටහන් කළ යුතුය.

08. කළාප රාජකාරි වල නිරතවන නිලධාරීන්ට ඔවුන් රැගෙන එන වාහන යම් අවදානකමට මුහුණු දෙමින් රාජකාරි වල නිරත කර වීමට සිදුවන හෙයින් ඉහත 02 ඡේදයේ සඳහන් මුදලට අමතරව රුපියල් එක්දහසක ( රු. 1000.00 ක) මුදලක් ගෙවිය හැකිය.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

**සමන් ශ්‍රී රත්නායක,**
මැතිවරණ කොමසාරිස් ජනරාල්,

**පිටපත්** : 1. විගණකාධිපති
2. ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව.
3. අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)
4. ප්‍රධාන මූල්‍ය නිලධාරී
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක
6. ගණකාධිකාරී (ගෙවීම්)

සටහන :- **ඉහත අංක 06 හි සඳහන් දිස්ත්‍රික්ක හැර සෙසු දිස්ත්‍රික්කවල කලාප රාජකාරි සඳහා පිටතින් පැමිණෙන සහකාර තේරීම් භාර නිලධාරීන්ගේ පෞද්ගලික වාහන කලාප රාජකාරි සඳහා යෙදවීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා මාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.**

සභාපති
**තවිසාளர்**
දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/தொலைநகல்: 011-2868445
*e-mail :comelesl@sltnet.lk*

සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන)
உதவித் தேர்தல்கள் ஆணையாளர் (நிருவாகம்)
දුරකථන/தொலைபேசி: 011-2868450
ෆැක්ස්/தொலைநகல் : 011-2868450
*e-mail : admin@slelections.gov.lk*

පරිපාලන නිලධාරී
நிருவாகஅலுவலர்
දුරකථන/தொலைபேசி: 011-3083371
ෆැක්ස්/தொலைநகல் : 011-3083371
*e-mail : info@slelections.gov.lk*

(පිටපත් දෙකකින් සම්පූර්ණ කරන්න.)



## පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05
## ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන්/ සහකාර තේරීම් භාර නිලධාරීන් රැගෙන එනු ලබන පෞද්ගලික වාහන පිළිබඳ තොරතුරු

1. නිලධාරියාගේ නම : ..........................................................................................
2. ස්ථිර තනතුර : ...............................................................................................
3. කාර්යාලයීය ලිපිනය : ...................................................................................
4. පෞද්ගලික ලිපිනය : .....................................................................................
5. ජංගම දුරකතන අංකය : .................................................................................
6. රැගෙන එන පෞද්ගලික වාහනය පිළිබඳ තොරතුරු

   වාහනයේ අංකය :........................................ (පෙට්‍රල්/ඩීසල්) *

   වාහනය තමාගේ ද / කලත්‍රයාගේ ද යනවග :..........................................................

   ***(සනාථ කිරීමට ආදායම් බලපත්‍රයේ ඡායා පිටපතක් මීට අමුණන්න.)***

7. තේරීම් භාර නිලධාරි වෙත වාර්තා කළ දිනය හා වේලාව :

   දිනය : 2020.08. ..........          වේලාව : ............................

මම 2020.08. ......... දින ඉහත අංක දරණ මාගේ / කලත්‍රයාගේ වාහනයෙන් * ...................... දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීමේ රාජකාරී සඳහා පැමිණි බව සහතික කරමි.

2020.08. .........          .............................

සම්පූර්ණ අත්සන :
(නිලධාරියාගේ නම සහිත නිල මුද්‍රාව)

.................................................................................................................................

### "ආ" කොටස - (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා )

ඉහත නම සඳහන් නිලධාරී ....................................................................... මහතා / මහත්මිය/ මෙනවිය අංක ...................... දරණ වාහනයෙන් පැමිණි බවට මම පෞද්ගලිකවම සෑහීමකට පත්වෙමි. ඔහු / ඇය .............................. දින ................. වේලාවට මා වෙත වාර්තා කළ බවත් ................................... දින .................................. වේලාවට එම වාහනයෙන් ආපසු පිටත්ව ගිය බවත් සහතික කරමි.

දිනය : 2020.08.

සම්පූර්ණ අත්සන : ...................................
සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන)
(නම සහිත නිල මුද්‍රාව තබන්න.)

**සැ.යු. :** පෞද්ගලික වාහන රැගෙන එන ඉහත සඳහන් සෑම නිලධාරියෙකු විසින්ම තමන් පැමිණි වහාම මෙම ආකෘතිය පිටපත් දෙකකින් සම්පූර්ණ කර තම වාහනයේ ආදායම් බලපත්‍රයේ ඡායා පිටපතක් ද සමග සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) වෙත භාරදිය යුතුය. ආපසු පිටත්ව යාමට ප්‍රථම මෙහි "ආ" කොටස සහකාර තේරීම්භාර නිලධාරී (ප්‍රවාහන) ලවා සම්පූර්ණ කරවාගෙන එක් පිටපතක් ලබාගත යුතුය. ගෙවීම් කිරීම සඳහා වවුචරය සමග එම පිටපත අමුණා ඉදිරිපත් කළ යුතුය.

❖ විශේෂ හේතූන් යටතේ අවිවාහක නිලධාරීන්ට පියා, මව, සොහොයුරු , සොහොයුරියන්ට අයත් වාහන ද විවාහක නිලධාරීන්ට - පියා, මව, දූ දරුවන් සතු වාහන භාවිතා කළ හැකිය.

**(* - අනවශ්‍ය වචන කපා හරින්න.)**

(පිටපත් දෙකකින් සම්පූර්ණ කරන්න.)

V-5

## පාර්ලිමේන්තු මැතිවරණය – 2020.08.05
## ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන්/ සහකාර තේරීම් භාර නිලධාරීන් රැගෙන එනු ලබන පෞද්ගලික රියදුරන්ගේ පැමිණීමේ සහතිකය.

01. වාහනය අයිති නිලධාරියාගේ නම : ..............................................
02. තනතුර : ..............................................
03. අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව නම හා ලිපිනය : ..............................................
04. රැගෙන ආ වාහනයේ අංකය : ..............................................
05. වාහනයේ රියදුරු වශයෙන් යොදාගත් අයගේ නම : ..............................................
06. ඔහුගේ ලිපිනය : ..............................................
07. ජාතික හැඳුනුම්පත් අංකය : ..............................................
08. රියදුරු බලපත් අංකය : ..............................................
09. රියදුරු මහතාගේ අත්සන : ..............................................

ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි/ සහකාර තේරීම් භාර නිලධාරි වශයෙන් .............................. දිස්ත්‍රික්කයේ රාජකාරි සඳහා ඉහත අංක දරණ වාහනයෙන් පැමිණි මම එම වාහනයේ රියදුරු ලෙස .............................................................. මහතා යොදා ගත් බව සහතික කරමි.

දිනය : 2020

..............................................
සහකාර තේරීම් භාර නිලධාරියාගේ අත්සන
(නම සහිත නිල මුද්‍රාව තබන්න.)

..............................................................................................

### "ආ" කොටස - (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ඉහත නම් සඳහන් නිලධාරී මහතාට අයත් අංක .............................................. දරණ වාහනයේ රියදුරු ලෙස .............................................................. මහතා පැමිණි බව සහතික කරමි.

දිනය : 2020

..............................................
සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන)
(නම සහිත නිල මුද්‍රාව තබන්න.)

**සැලකිය යුතුය. :** මෙම ආකෘතිය පිටපත් දෙකකින් සම්පූර්ණ කර සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) වෙත භාරදිය යුතුය. "ආ" කොටස සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) විසින් සම්පූර්ණ කරවාගෙන එක් පිටපතක් ලබාගත යුතු අතර එය රියදුරුගේ ගමන් වියදම් ඉල්ලුම් පත්‍රයට අමුණා ඉදිරිපත් කළ යුතුය. ඒ සමග රියදුරු බලපත්‍රයේ ඡායා පිටපතක් ද ඉදිරිපත් කළ යුතුවේ.

(PE/2020/TR-09හි 7 ඡේදයට අදාල ආකෘතිය)

## පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05

## කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් සතු පෞද්ගලික වාහන භාවිතා කිරීම.

| නිලධාරියාගේ නම | නිත්‍ය තනතුර | දෙපාර්තමේන්තුව | වාහන අංකය | ඉන්ධන දැවීම (ලීටරයට කිලෝ මීටර්) | නිලධාරියාගේ අත්සන | සහකාර තේරීම්භාර නිලධාරී (ප්‍රවාහන) විසින් සම්පූර්ණ කල යුතුයි | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | දිස්ත්‍රික්කයට වාර්තා කිරීමෙන් පසු මයිලෝමීටරය | සහකාර තේරීම්භාර නිලධාරී යෙදවූ කලාපය | කලාපයේ ධාවනයෙන් පසුව මයිලෝමීටරය | ධාවනය කල මුළු කි.මීටර් ගණන | සහකාර තේරීම්භාර නිලධාරී (ප්‍රවාහන) අත්සන |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |